00367

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2021/2022

නීති ක්‍රම - LLU3904/LWU1412

කාලය - පැය(03) තුනයි.

---

දිනය - 2023.01.27 වේලාව - පෙ.ව.09.30 - ප.ව. 12.30

---

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : 08

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න පහ (05) කට පමණක් පිළිතුරු සපයන්න.

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

## I කොටස - රෝම නීතිය

01. 45 වියැති රෝම පුරවැසියකු වූ ජූලියස් තම පියාගේ මරණින් පසු පවුලේ පීතෘ මූලිකයා බවට පත් වූයේ ය. ජූලියස් සහ ඔහුගේ භාර්යාව වූ ක්ලෝඩියා ට දියණියන් දෙදෙනෙකු සහ පුත්‍රයෙක් සිටියේ ය. ජූලියස් ට පියාගෙන් යම් දේපල උරුම වුව ද වැරදි ආයෝජන සහ වැරදි කළමනාකරණය හේතුවෙන් එම දේපලෙන් වැඩි කොටසක් ඔහුට අහිමි විය. තමාගේ පවුල නඩත්තු කිරීමට ඔහුට නොහැකි වූ හෙයින් ජූලියස් තම වැඩිමහල් දියණිය වූ සිල්වියා මැණික් වෙළෙන්දෙකුට විකුණුවේය. ඉන්පසු ජූලියස් ඔහුගේ බාල දියණිය වූ කැමිලියා ගේ කැමැත්තට පටහැනිව, ඇයට වඩා වසර 25 කින් වැඩිමහල් වූ ධනවත් වැන්දඹු පුරුෂයෙකුට ඇය ව විවාහ කර දීමට කටයුතු පිළියෙල කළේය. සෙනෙට් සභිකයකු ගේ අශ්ව ගාලෙහි සේවය කළ තමාගේ පුත්‍රයා වූ නීරෝ විසින් උපයාගත් මුදල් ද ජූලියස් ලබාගත් අතර, සූදු ක්‍රීඩාවට යෙදවීමෙන් එම මුදල් අහිමි විය. අවසානයේ දී, 65 වියැති රෝම පුරවැසියකු වූ උර්බානෝ විසින් අධිරාජ්‍ය ආඥාවක් මගින් ජූලියස් ව පුත්‍රෝප්තියට පත් කර ගන්නා ලදී.

(අ) සිල්වියා, කැමිලියා සහ නීරෝ සම්බන්ධයෙන් ජූලියස් ගේ ක්‍රියාවන් හි වලංගු භාවය සාකච්ඡා කරන්න. (ලකුණු 14)

(ආ) උර්බානෝ විසින් ජූලියස් ව පුත්‍රෝප්තියට පත්කර ගැනීම හේතු කොටගෙන ජූලියස්ගේ පවුල කෙරෙහි ඇති වූ ප්‍රතිඵල සාකච්ඡා කරන්න. (ලකුණු 06)

02. පහත දැක්වෙන ප්‍රකාශයන්ගෙන් එකක් (01) පිළිබඳ ව විවේචනාත්මකව අදහස් දක්වන්න.

(අ) 'පවුලේ සාමාජිකයන්ට ප්‍රමාණවත් ලෙස දේපල ලැබෙන බවට රෝම අනුප්‍රාප්ති නීතිය සහතික කර ඇත.'

(ආ) 'ද්‍රව්‍ය (*res*) පිළිබඳ අයිතිය ලැබීමේ ක්‍රම (*Ius Naturale* සහ *Ius Gentium* යන මූලාශ්‍ර දෙකෙන් ම උකහා ගෙන ඇත." (ලකුණු 20)

03. පෝලිනස් සහ කැස්කා රෝමයෙන් පිටත පිහිටි ගම්මානයක වූ යාබද ඉඩම් දෙකක ඉදිකළ නිවාසයන් හි ජීවත් වෙති. පෝලිනස් ගේ ඉඩමෙහි කිසිදු ජල මූලාශ්‍රයක් නොතිබීම හේතුවෙන් කැස්කාගේ ඉඩම මතින් ජලය ගෙනයාමේ අයිතිය පෝලිනස් ට ලබා දී තිබුණි. තම භාර්යාව මියයාම නිසා පෝලිනස් තමාගේ මිත්‍රයකු වූ ඇන්ටෝනියෝ හට තම නිවස සහ ඉඩමෙහි ඵල ප්‍රයෝජන අයිතිය ලබාදී තමාගේ දෙමාපියන් සමග වාසයට යයි.

පහත දැක්වෙන අවස්ථාවන් හි නෛතික තත්ත්වය විස්තර කරන්න.

අ) එක් ගමන් වාරයකට එක් රිදී කාසියක් බැගින් ගෙව්වොත් මිස ඇන්ටෝනියෝ ට තම ඉඩම මතින් ජලය ගෙන යාමට ඉඩදීම කැස්කා ප්‍රතික්ෂේප කරයි. (ලකුණු 06)

ආ) ඇන්ටෝනියෝ ඉඩමෙහි වූ ඕක් ගස් කිහිපයක් කපා, විවාහයට සූදානම් වන තම සොහොයුරිය වෙනුවෙන් ගෘහ භාණ්ඩ සාදයි. (ලකුණු 06)

ඇ) ඇන්ටෝනියෝ මසකට රිදී කාසි 25 ක මුදලකට නිවසෙහි කොටසක් පළතුරු වෙළෙන්දෙකුට කුලියට දෙන අතර, වගා කලහැකි ඉඩ ප්‍රමාණය වැඩි කර ගැනීම පිණිස ඉඩමේ මිටි තාප්පය කඩා දමයි. (ලකුණු 08)

04. පහත දැක්වෙන දෑ පිළිබඳ සටහන් ලියන්න.

අ) භාණ්ඩ ගිවිසුම් ;

ආ) ජස්ටිනියන් විසින් හඳුනා ගන්නා ලද දීලික්ත හතර.

(ලකුණු 10 x 2 = 20)

## II වන කොටස - නීති ක්‍රම

05. "…. නීතියේ මූලාශ්‍ර යන යෙදුම විවිධ අර්ථයන් හි භාවිත කළ හැකි ය….. බොහෝ අවස්ථාවන් හි දී මූලාශ්‍ර යන යෙදුම භාවිත කරනු ලබන්නේ යම් රටක නීතියේ නියමාකාර අන්තර්ගතය තීරණය කරන්නා වූ ආයතනයන් හැඳින්වීම සඳහා ය….. "

(Legal Method book 1, The Open University of Sri Lanka, Page 19.)

ශ්‍රී ලංකාවේ නීති මූලාශ්‍රයන් ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

06. සෙලිනියා හි ගිනි අවි සහ වෙනත් අන්තරාදායක ආයුධ පාලන පනතේ 5 වන වගන්තියේ දැක්වෙන්නේ සෙලිනියා රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය විසින් නිකුත් කළ බලපත්‍රයක් නොමැති ව යම්කිසි පුද්ගලයකු ගිනි අවි, උණ්ඩ හෝ ඕනෑම ආකාරයක පුපුරණ ද්‍රව්‍ය ලාභ ඉපයීම පිණිස විකිණීම වරදක් වන බවයි. එම පනතට අනුව එවැනි වරදක් සඳහා දඩුවම අවම වශයෙන් වසර විස්සක සිරගත කිරීමකි. සෙලිනියානු යුධ හමුදාවේ භටයකු වූ රිචඩ්, තමන් ට නිකුත් කර තිබූ තුවක්කුව තම පියාගේ හදවත් සැත්කමට අවශ්‍ය මුදල් සොයා ගැනීම පිණිස විකිණුවේ ය. මෙම පනතේ 5 වන වගන්තිය යටතේ රිචඩ් ට චෝදනා නැගී ඇත.

ව්‍යවස්ථා අර්ථ නිරූපණ රීති අනුසාරයෙන් රිචඩ් ගේ තත්ත්වය සාකච්ඡා කරන්න.

යෝග්‍ය නඩු තීරණ මගින් ඔබේ පිළිතුර තහවුරු කරන්න. (ලකුණු 20)

07. "….. ශ්‍රී ලංකාව, අධිකරණ පූර්ව නිදර්ශන අනුගමනය පිළිබඳ පොදු නීති න්‍යාය (වැඩි ප්‍රමාණයකට) සහ ලිඛිත නීති පදනම් වූ සිවිල් නීති න්‍යාය යන දෙකෙහි ම ආභාසය ලබා ඇති බව කිව හැකි ය….."

(Cooray, L.J.M., An Introduction to the Legal System of Sri Lanka, Page 156)

ඉහත ප්‍රකාශය මගින් පිළිබිඹු වන තත්ත්වය ශ්‍රී ලංකාවේ අධිකරණ පූර්ව නිදර්ශන අනුගමනය කිරීම සම්බන්ධයෙන් නිවැරදි වේ ද?

අදාල නඩු තීන්දු උදාහරණයන් දක්වමින් විවේචනාත්මක ව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

08. ජෝසප්, වැලිගොඩ නගරයේ මාර්ගයක් අසල වෙළඳසැලකට පිටතින් පිහිටි කාණුවක් මත තබාගෙන විවිධ කෙටි කෑම වර්ග සහ රසකැවිලි අලෙවි කර ජීවිකාව උපයාගත් වීදි වෙළෙන්දෙකි. වසර පනහකට වැඩි කාලයක් මෙම ස්ථානයේ ම කැවිලි අලෙවි කිරීමේ නිරත වූ තම පියාගෙන් ජෝසප් ට මෙම ව්‍යාපාරය හිමි විය. වසර පහළොවකට ඉහත දී ජෝසප් ගේ පියා ඉන්දියාවේ වෙලන්කන්නි දේවස්ථානයට වන්දනා චාරිකාවක් යාම හේතුවෙන් දින දහයක කාලයකට පමණක් ව්‍යාපාරය වසා තිබුණි. කාණුවක් මත තබා ආහාර ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීමෙන් හා අලෙවි කිරීමෙන් ජෝසප් විසින් නගර සභා ආඥා පනතේ ප්‍රතිපාදන උල්ලංඝනය කරන බව දක්වමින්, ඔහුගේ වෙළඳ භාණ්ඩ එම ස්ථානයෙන් ඉවත් කර ගන්නා ලෙස වැලිගොඩ නගර සභාව ජෝසප් ට නියෝග කළේ ය.

මාර්ගය අසල මේ ආකාරයෙන් ආහාර ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීම හා අලෙවි කිරීම නගර සභා ආඥා පනත පැනවීමට දීර්ඝ කාලයකට පෙර සිට ම පැවති ව්‍යවහාරයක් බව දක්වමින් ජෝසප් මෙම නියෝගයට එරෙහි ව අභියාචනය කළේ ය. ඔහු තවදුරටත් දක්වා සිටියේ කිසිවකුට අපහසුතාවක් ඇති නොවන අන්දමින් මෙම ව්‍යවහාරය වසර පනහකට වැඩි කාලයක් තිස්සේ අඛණ්ඩ ව පවත්වාගෙන ආ බවත්, එම නිසා ආහාර ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීමට හා අලෙවි කිරීමට ඇති අයිතිවාසිකමක් ලෙස මෙය පිළිගත යුතු බවත් ය.

වලංගු සිරිතක පැවැත් ම ඔප්පු කිරීමට ජෝසප් ට හැකි වේ ද? දේශීය සිරිතක් බලාත්මක කිරීම සම්බන්ධයෙන් අධිකරණය විසින් අදාල කරගෙන ඇති පරීක්ෂණ අනුසාරයෙන් ඔහුට උපදෙස් දෙන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි.